ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම
අඛණ්ඩ ඇගයුම් පරීක්ෂණය II -2022/2023
LLU5712 - පොදු අන්තර්ජාතික නීතිය

කාලසීමාව - පැය එකයි (01)

---

දිනය: 2023 දෙසැම්බර් 03 | වේලාව: ප.ව. 3.30 - ප.ව. 4.30

---

මුළු ප්‍රශ්න ගණන: **02**
එක් **(01)** ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපේක්ෂකයින්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ

**1.** රාජ්‍යන්හි අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව වන මොන්ටෙවීඩියෝ සම්මුතියේ ඇතුළත් සාම්ප්‍රදායික නිර්ණායකයන්, රාජ්‍යත්වය තීරණය කිරීමේදී අත්‍යවශ්‍ය මිණුම් දඬු ලෙස දිගු කලක් තිස්සේ සලකා බලනු ලැබේ. මීට අමතරව සමකාලීන සාකච්ඡා තුළ, අන්තර්ජාතික පිළිගැනීම රාජ්‍යයත්වය යාවනය කිරීමේ මූලික නිර්ණායකයක් ලෙස සලකා බලනු ලබයි.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද?

අදාළ නඩු තීන්දු සහ සමකාලීන උදාහරණ ඇසුරින් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

**(ලකුණු 20 යි)**

**2.** හර්මෝනියා (Harmonia) රාජ්‍යයේ පුරවැසියන් වන 'මායා' (Maya) සහ ඇගේ මිතුරෙකු වන 'කියන්' (Kian) යන දෙදෙනා කොන්කොර්ඩියා (Concordia) රාජ්‍යයේ සංචාරය කළහ. ඔවුන්ගේ සංචාරය අතරතුර, කොන්කෝඩියා රාජ්‍යයේ ආණ්ඩුව සහ 'යුනිටි' නම් කැරලිකාර පෙරමුණ අතර දේශපාලන නොසන්සුන්තාවක් ඇති වී තිබිණි. රාජ්‍යයේ ඉතිහාසය පිළිබඳව කැමැත්තක් දක්වන කියන් (Kian), කොන්කොර්ඩියාහි ආරක්ෂක බලධාරීන් විසින් තහනම් ස්ථානයක් ලෙස ප්‍රකාශයට

පත් කරන ලද ඓතිහාසික ස්ථානයක් ගවේෂණය කිරීමට තීරණය කළේය. කෙසේ වුවද ආරක්ෂක අධිකාරීන්ගේ අනතුරු ඇඟවීම් නොතකා කියන් එම ඓතිහාසික ස්ථානය නැරඹීමට ගියේය. එහිදී 'යුනිටි' කැරලිකාර පෙරමුණේ සාමාජිකයන්ගේ ග්‍රහණයට නතු වූ කියන් පිහි ඇනුමකින් මිය යන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කියන්ගේ පවුලට දැඩි ශෝකයට හා අහිමිවීමකට මුහුණ දීමට සිදු විය. එමෙන්ම ප්‍රජා උත්සවයකට සහභාගී වෙමින් සිටියදී, කොන්කෝඩියා හි ප්‍රකට රාජ්‍ය නිලධාරියෙකු සහ ඔහුගේ සහචරයින් අතින් මායා සමූහ දූෂණයට ලක් විය. තමා මුහුණ දුන් මේ අනපේක්ෂිත සිදුවීම නිසා මායා කම්පනයට පත් වූවාය.

කියන් සහ මායාගේ සිදුවීම් පිළිබඳව අන්තර්ජාතික නීතිය ඇසුරින් මතයක් සැපයීම සඳහා ඔබව හර්මෝනියා රාජ්‍යයේ නීති උපදේශක ලෙස පත් කර ඇතැයි උපකල්පනය කරන්න.

නඩු තීන්දු සහ ප්‍රායෝගික උදාහරණ ඇසුරින් මෙම සිදුවීම් සඳහා අන්තර්ජාතික නීතියේ '**අධිකරණ බලය' (Jurisdiction)** අදාළ වීම පිළිබඳ ඔබේ අදහස දක්වන්න.

**(ලකුණු 20 යි)**

- සියලු හිමිකම් ඇවිරිණි -